www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුක්රේනයේ බල අරගලය: යුශ්චෙන්කෝ සහ යනුකොවිච් පෙනී සිටින්නේ කුමක් අරභයා ද?

**Power struggle in Ukraine: what do Yushchenko and Yanukovich stand for?**

**පැට්‍රික් රිටාර් සහ ඇන්ඩි නික්ලස් විසිනි**
**2004 දෙසැම්බර් 01**

විරුද්ධ පක්ෂ අපේක්ෂක වික්ටර් යුශ්චෙන්කෝ සහ වර්තමාන අගමැති වික්ටර් යනුකොවිච් යන දෙපාර්ශවයම යුක්රේනයේ බලය සඳහා සටන්වැදී සිටින අතර ඉන් එකක් වත් පුලුල් ජනතා උවමනාවන් නියෝජනය නො කර යි.

කන්ඩායම් දෙකම සුජාත වූ උවමනාවන් හා අවශ්‍යතාවන් සඳහා පාර්ශ්වීයව ආයාචනා කරති. යුශ්චෙන්කෝ, මාධ්‍ය නිදහස මර්දනය කිරීම, මැතිවරන දූෂනය, ආදියෙන් සංලක්ෂිත වූ ඒකාධිපති ක්‍රමවේදයන් හා එම පාලනය කෙරෙහි ඇති පුලුල් වෛරය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ඉල්ලීම් ද, යනුකොවිච් බටහිර ප්‍රාග්ධනයට රට මුලුමනින්ම විවෘත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස විය හැකි ව්‍යසනකාරී සමාජ ඵලවිපාක සහ නැගෙනහිර දිග යුක්රේනයේ කර්මාන්ත ප්‍රදේශ සහ රුසියාව අතර සම්ප්‍රදායානුකූල සමීප සබඳතා දුර්වලවීම පිලිබඳව ද බිය පල කරති.

එහෙත් මෙම වංචනික ආයාචනයන් සේවය කරන්නේ, දරිද්‍රතාවය සහ පලල් ජනතාව දේශපාලනයෙන් ඉවත් කර තැබීම සමග බරපතල ලෙස ප්‍රතිවිරෝධීව ස්ථාපිතව සිටින ධනය සහ බලය හිමි තුනී ප්‍රභූ තට්ටුවක අවශ්‍යතාවන් ආවරනය කර තැබීම පිනිස ය. දශක ගනනාවක ස්ටැලින්වාදී පාලනය කම්කරු පන්තිය තුල වික්ෂිප්තභාවයේ සහ දේශපාලන මංමුලාවේ උරුමයක් ඉතිරි කර ඇති බැවින් මෙම ආයාචනයන් ප්‍රතිචාරයක් ලබාගෙන තිබේ.

දේශීය කම්කරු පන්තිය සූරාකෑම සඳහා හොඳම කොන්දේසි අන්තර්ජාතික සංගත සඳහා පුද කර දීමට දක්ෂිනාංශික හා අන්ත දක්ෂිනාංශික පක්ෂ තරග වැදී සිටින හංගේරියාව, පෝලන්තය සහ අනෙකුත් නැගෙනහිර යුරෝපීය රටවල් දෙස හැරී බැලීමෙන් කෙනෙකුට යුශ්චෙන්කෝ කල්ලිය ඇසගසා සිටින ''ප්‍රජාතන්ත්‍රවාදයේ'' මාදිලිය පිලිබඳව හොඳ අදහසක් ඇති කර ගත හැකි ය. වෙනිසියුලා ජනාධිපති හියුගෝ ශාවෙස් පෙරලා දැමීමේ ප්‍රයත්නයන්ට දැඩිව සම්බන්ධ වූ ඇමරිකානු නැෂනල් එන්ඩෝමන්ට් ෆෝ ඩිමොක්‍රසි වැනි සංවිධානවලින් ලබන සහයෝගයෙන්ම මෙම 'ප්‍රජාතන්ත්‍රවාදී' විපක්ෂයේ වාර්තාව පිලිබඳව වෙලුම් ගනනක දේ කියැවේ.

පසුගිය වසර 15 තිස්සේ යුක්රේනියානු බැර කර්මාන්ත අත්පත්කරගත් කතිපයාධිකාරී කොටස් යනුකොවිච් නියෝජනය කරයි. ඔවුන් අතිවිශාල ධනවතුන් බවට පරිවර්තනය කල එම දේශපාලන බලය තමන් අත ම තබා ගැනීමට අධිශ්ඨානශීලිව සිටිති.

කන්ඩායම් දෙක මෙන්ම ඔවුන්ගේ සහායක පාර්ලිමේන්තු කන්ඩායම් ද අඩු හෝ වැඩි වසයෙන් විදේශයන්ගෙන් මෙහෙයවුනු අතර විදේශ සහයෝගය ද ලබාගත්හ.

යනුකොවිච්ට සහාය පිනිස රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් කල මැදිහත් වීම් බටහිර මාධ්‍ය විසින් සවිස්තරව වාර්තා කල අතර එය හෙලා දැක්කාහු යුක්රේනයේ සිදුවීම් ප්‍රානසම රුසියානු අවශ්‍යතාවන්ට තර්ජනයක් ලෙස පුටින් සලකයි.

බෝල්ටික් රාජ්‍ය යුරෝපීය සංගමයට (යු.සං) ඇතුලු වීමෙන් අනතුරුව ඇමරිකානු හමුදා (කලින් පැවති සෝවියට් සමූහාන්ඩු ද ඇතුලු) මධ්‍යම ආසියාවේ ස්ථානගත කිරීම සහ වොෂින්ටන් මෙහෙයුමකින් ජෝජියා පාලනය වෙනස් කිරීම යන කරුනු නිසා යුක්රේනය බටහිර හිතවාදී ආන්ඩුවක පාලනයට නතු වුව හොත් තමන් හුදෙකලා වෙතැයි මොස්කෝව බියපත්ව සිටී. පෙර සෝවියට් සංගමයේ ඉතාම වැදගත් කාර්මික කලාපයක් මත සිය ආනුභාවය අහිමිවීමේ ද, තමන්ගේ ඉතාම වැදගත් අමුද්‍රව්‍යයන් වන තෙල් සහ ගෑස් අපනයන මාවත් පාලනය අහිමිවීමේ ද තර්ජනයට රුසියාව ලක්ව සිටී.

අනෙක් අතට බටහිර මාධ්‍ය රුසියාවට වඩා විශාල පරිමානයකින් වුව ද තරමක් අඩු ප්‍රසිද්ධියකින් යුතුව

යුක්රේනයේ ජනාධිපතිවරනය කූට ලෙස සැලසුම් කිරීම සඳහා මැදිහත් වූ, ඇමරිකානු සහ යුරෝපීය භූමිකාවන් පිලිබඳව සඳහන් කලේ යම්තම්නි. විරුද්ධ පක්ෂයට ඔවුන් දක් වූ සහයෝගය ක්‍රියාකාරීන් පුහුනුව සැපයීමේ සිට දේශපාලන ගුරුහරුකම් දීම හා මිලියන ගනන් ඩොලර් සැපයීම දක්වා පරාසයක විහිද තිබුනි. ධූරය හොබවන ජනාධිපති ලියොනිඩ් කුච්මා යටතේ මැතිවරන නිලධාරීන්ට යනුකොවිච් ජයග්‍රාහකයා ලෙස ප්‍රකාශ කල, නොවැම්බර් 21 දා අවසන් වූන මැතිවරනයෙන් පසුව ඔවුහු විවෘතවම යුශ්චෙන්කෝගේ පාර්ශ්වය ගත්හ.

බටහිර බලවතුන් නොකඩවා දැඩි ලෙස කල මැදිහත් වීමෙන් අභ්‍යන්තර ගැටුම් උත්සන්න වූ අතර රට සිවිල් යුද්ධයේ මුවවිටට ඇද දැමී ය.

## වැඩට බැස සිටින බලවේග මොනවාද?

යුක්රේනයේ බල අරගලය අධිපති ප්‍රභූව ඇතුලත දිගුකලක් තිස්සේ පැසවමින් තිබූ ගැටුමක් කලඑලියට ගෙනැවිත් තිබේ. යුශ්චෙන්කෝ සහ ඔහුගේ ප්‍රමුඛ සහායිකාවක් වන යූලියා ටිමොශෙන්කෝ, විදේශ ප්‍රාග්ධනය සඳහා රට වේගවත්ව විවෘත කිරීම සඳහා අදිටන් කරගෙන සිටින පාලක ස්ථරයේ කොටසක් නියෝජනය කරති. 1993 සිට 1999 දක්වා කාලය ද යුශ්චෙන්කෝ රටේ මහ බැංකු අධිපති තනතුර දැරී ය. අනතුරුව ඔහු වසර එකහමාරක කාලයක් අගමැතිවරයා ලෙස සේවය කලේ ය. වසර දෙකකට පැවැත් වූ මැතිවරනයේ දී ශක්තිමත්ම පාර්ලිමේන්තු කන්ඩායම පෙලගස්වා ගත් විරුද්ධ පක්ෂ සන්ධානය වූ ''අපේ යුක්රේනය'' ට ඔහු නායකත්වය දුන්නේ ය. යුශ්චෙන්කෝ බටහිර ප්‍රතිසංස්කරනවාදියෙකු ලෙස පෙනී සිටිමින් දේශපාලන-ආර්ථික ''කල්ලි ව්‍යුහය'' බිඳ හෙලීමට සහ ''ප්‍රජාතන්ත්‍රවාදී ආයතන'' වර්ධනය කිරීමට ද ශක්තිමත් කිරීමට ද ඔහු වැයම් කරමින් සිටින බව මවාපායි. යුක්රේනය නේටෝව සහ යුරෝපීය සංගමය තුලට දක්කීම ඔහුට අවශ්‍ය වන අතර හේ ''බටහිර පන්නයේ'' ධනවාදයක් නිර්දේශ කරයි.

හිටපු උප අගමැතිනිය වූ කෝටිපතිනියක වන (සමහර මූලාශ්‍රවලට අනුව ප්‍රකෝටිපතිනියක වන) යූලියා ටිමොශෙන්කෝ නායකත්වය දෙනු ලබන ජාතිකවාදී බැට්කියුශ්ට්ෂයිනා පක්ෂයේ සහාය ඔහුට ලැබෙයි. ඇය ධනය ගොඩගසා ගත් අන්දම යනුකොවිච් කඳවුරේ නරකම කතිපයාධිකාරීන් හා මාෆියා ලොක්කන්ගේ ක්‍රමයට සමාන ය. තම ධනය උපයා ගැනීමට පසුබිම සැකසූ කුච්මා කල්ලියට එරෙහි ඇගේ 'නිදහස' හා 'ප්‍රජාතන්ත්‍රවාදය' පිලිබඳ ආයාචනා අතිශයින්ම නින්දාශීලි ය.

44 වියැති ටිමොශෙන්කෝ නැගෙනහිර දිග යුක්රේන නගරයක් වන ඩ්නෙප්‍රොපෙට්‍රොව්ස්ක් වලින් පැමිනි කතකි. 1990 ගනන් මුල දී ඇය ඇගේ සහකරු වන පැවල් ලැස්රෙන්කෝ සමග කීව් බලා පැමිනියා ය. ඩ්නෙපොපෙට්‍රොවුස්ක්වලින් ම බිහි වූ කුච්මාගේ ගමන් මගේ මේ දෙදෙනා ද ගමන් කලහ.

1996 දී ලැස්රෙන්කෝ අගමැති පදවියට පත් වූ අතර ටිමොශෙන්කෝ සමග හවුලේ සැලකිය යුතු ධනස්කන්ධයක් ගොඩනගා ගත්තේ ය. රුසියානු තෙල් සහ ගෑස් යුක්රේනියානු කාර්මික භාන්ඩ සඳහා හුවමාරු කර ගැනීමේ යාන්ත්‍රනයක් ටිමොශෙන්කෝ විසින් වර්ධනය කරනු ලැබුවේ ඇය පුද්ගලිකව පිහිටු වූ එක්සත් බලශක්ති පද්ධතිය නම් සමාගමේ සේප්පුවලට මෙම ක්‍රියාවලියෙන් ඉපැයෙන දෙයින් සැලකිය යුතු කොටසක් ඇතුලුවීමේ කොන්දේසි සකස් කර ගනිමින් ය.

ලැසරෙන්කෝ විවිධ කතිපයාධිකාරීන් සමග ගැටුම්වලට පැටලැවුන අතර 1998 දී දූෂන සෝලියකින් පසුව කුච්මා විසින් අතහැර දමනු ලැබී ය. ලැසෙරෙන්කෝ දැනට වංචනික මුදල් ගනුදෙනු සම්බන්ධ චෝදනාව මත ඇමරිකානු සිර ගෙදරක ලැග සිටි. ටිමොශෙන්කෝ මෙම කාරනයෙන් බේරී ලිස්සා යාමට සමත් වූ අතර 1999 දී අගමැති යුශ්චෙන්කෝගේ දෙවැනියා ලෙස පත්කරනු ලැබී ය.

බ්‍රිතාන්‍යයේ *ගාර්ඩියන්* පුවත් පත නොවැම්බර් 26 දා සංස්කරනයේ තැනක, ටිමොශෙන්කෝ ''ඩොලර් බිලියන 11 ගැහැනිය'' ලෙස විස්තර කිරීමට මුලු පරිච්ඡේදයක්ම වැය කර තිබෙන කැසිනෝ මොස්කව් නමැති මැතිව් බ්‍රෙෂින්ස්කි ගේ පොතකින් උපුටා දක්වීමක් කරයි. සමස්තයක් ලෙස රට කුසගින්නේ සිටිය දී රටේ ධනයෙන් සියයට 20ක් ඇයගේ පාලනයෙහි තබා ගෙන සිටින ඇය පැරනි සෝවියට් විශේෂ බලකායේ ඒකකයක් විසින් ආරක්ෂා කරන බව වාර්තා වෙයි.

ඇගේ පෞද්ගලික සේසත අත්පත් කරගැනීමේ දී දැන් ඇගේ විරුද්ධවාදී යනුකොවිච් කඳවුරට අඩු නො වන නින්දිත ලේවැකි ව්‍යාපාරයක ඇය ද නිමග්න වූයේ නමුදු දැන් ඇය ප්‍රජාතන්ත්‍රීය විරුද්ධ පක්ෂයේ නායිකාවක ලෙස තමන්ම පෙනී සිටියි.

සෝවියට් සංගමය බිඳ වැටීමෙන් අනතුරුව පැරනි ස්ටැලින්වාදී නිලධරයේ කන්ඩායමක් නොසිතිය හැකි තරම් ධනයක් ගොඩ ගසා ගැනීමට පෞද්ගලීකරනය යටතේ සාපරාධී ක්‍රම යොදාගත් අතර යුක්රේනියානු ආර්ථිකයේ සැලකිය යුතු කොටසක් තම තමන් අතර බෙදා ගත්හ. ඒ අතර රට වැඩෙන දරිද්‍රතාවෙන් ගිලගනු ලැබින. පෞද්ගලීකරනයේ ප්‍රධාන ඉලක්ක වූයේ යපස් හා ගල් අඟුරු නිධිවලින් පොහොසත් නැගෙනහිර දිග යුක්රේනයේ සංකේන්ද්‍රිත සෝවියට් යුගයේ

කර්මාන්තයන් ය. මෙම ප්‍රදේශයේ පතල්, ඉංජිනේරු කර්මාන්ත සහ අවිආයුධ නිෂ්පාදනාගාරයන්ගෙන් බහුල ය. කුච්මා සහ යනුකොවිච් පයගසා සිටින ආර්ථික අංශ මේවා ය.

යනුකොවිච් රීජනල් පක්ෂයේ සභාපතිවරයා වන අතර ඩොනෙට්ස්ක් මධ්‍යස්ථානය කර ගත් නැගෙනහිර දිග යුක්රේනියානු බැර කර්මාන්ත ප්‍රදේශයේ හිටපු ආන්ඩුකාරයා ද වෙයි. ඔහු යුක්රේනයේ ලොකුම පොහොසතා ලෙස සැලකෙන ඩොලර් බිලියන දෙකක් ලෙස තක්සේරු කල හිමිකම් කියන රිනාට් ඇශ්මෙටොව් විසින් නායකත්වය දෙන ඩොනෙට්ස්ක් කතිපයාධිකාරි කල්ලියේ දේශපාලන නියෝජිතයා ය.

1994 සිට ජනාධිපතිවරයා ලෙස සිටි කුච්මා ඩිනෙප්‍රොපෙට්‍රොවුස්ක්හි දැවැන්ත ආයුධ සමාගමක අධ්‍යක්ෂවරයා වූ අතර සෝවියට් යුගයේ දී ඉහල පෙලේ කේජීබී නියෝජිතයෙකු ද විය. මූල්‍ය වංශාධිපතියෙකු හා හිටපු අගමැතිද වූ තම බෑනනුවන් වන වික්ට පින්ෂක් සමග හවුලේ කුච්මා ඩිනෙප්‍රොපෙට්‍රොවුස්ක් කතිපයාධිකාරී කල්ලිය නියෝජනය කරයි.

සෝවියට් යුගයේ දී යුක්රේනය සහ රුසියාව අතර ආර්ථික සබඳතා අතිශයින්ම සමීප වූ අතර සෝවියට් සංගමය බිඳවැටී යුක්රේන ස්වාධීනත්වය ලැබීමෙන් අනතුරුව ද එම කිට්ටු සබඳතාවන් පැවතුනි. මූල්‍ය වංශක්කාරයන්ගේ විවිධ කල්ලිවල එකිනෙකට තදින් වෙලී ඇති උවමනාවන් තුල මෙය පිලිබිඹු වෙයි. උදාහරනයක් ලෙස යුක්රේනියන් ඇලුමිනියම් කර්මාන්තයේ සියයට 83ක තරම් කොටසක අයිතිය රුසියාව සතු ය.

රුසියානු තෙල් හා ගෑස් මත යුක්රේනියාවේ පැවැත්ම - අවශ්‍යතාවෙන් පහෙන් හතරක් රුසියාවෙන් සැපයේ - නැගෙනහිර අසල්වැසියා සමග වන සමීප ආර්ථික සබඳතාවනට යටින් පවතියි. රුසියාව මෙම තත්වය යුක්රේනය මත සිය ආනුභාවය පවත්වාගෙන යාමට යොදාගනී. බලශක්ති සැපයුම සලාකයට යටත් කිරීමෙන් සැලකිය යුතු පීඩනයක් යෙදීමට රුසියාවට හැකියාව තිබේ.

රුසියානු රජය සමග සමීප සබඳතා තිබෙන ලුක්ඔයිල් සහ ගෑස්ප්‍රොම් වැනි රුසියානු බලශක්ති සමාගම් යුක්රේනය තුල රුසියානු විදේශ අමාත්‍යාංශයේ ශාඛා ලෙස ක්‍රියාත්මක වන අතර හිටපු රුසියානු අගමැති ද ගෑස්ප්‍රොම් සභාපති ද වන වික්ටර් ශෙර්නොමිර්ඩින් 2001 සිට යුක්රේනියාවේ රුසියානු තානාපති වෙයි.

1994 බලයට පැමිනි තැන් සිට කුච්මා එක් අතකින් රුසියාව සමග ද අනෙක් අතින් ඇමරිකාව හා යුරෝපා සංගමය අතර ද සබඳතාවන්ගේ තුලනතාවයක් ඇතිකර ගැනීමට වෙර දරමින් යුක්රේනියාවට ස්වාධීන භූමිකාවක් වර්ධනය කර ගැනීමට මාන බැලී ය. සෝවියට් සංගමය බිඳවැටීමෙන් අනතුරුව මතු වී ආ විවිධ රාජ්‍යයන් සමූහයේ එකතුව වන ස්වාධීන සමූහාන්ඩුවේ (සීඅයිඑස්) ආර්ථික ආනුභාව ශක්තිමත් කිරීමට වෙර දරන ගමන්ම ඔහු යුක්රේනය යුරෝපා සංගමය සහ නේටෝව තුලට දක්කාගෙන යාමේ ප්‍රයත්නයක් ද ඇරඹී ය. සීඅයිඑස් ය තුල රුසියාව ආධිපත්‍යය දරයි.

පසුව අතහැර දමනු ලැබූ සේද මාවත - යුරෝපය හා ආසියාව අතර රුසියාව මගහැර ගමන් ගත් - යලි පනගැන්වීමේ ව්‍යාපෘතියකට යුක්රේනය ද සහභාගි විය. යුරෝපීය බලවතුන්ගේ ආශිර්වාදය මධ්‍යයේ 1998-99 කාලයේ දී ජෝර්ජියාව, උස්බෙකිස්තානය, අසර්බයිජානය සහ මොල්ඩේවියාව මෙම ව්‍යාපෘතියට සහභාගි විය. ඒ කාලයේ දී ම, කුච්මා යටතේ යුක්රේනියාව ඇමරිකානු මූල්‍යාධාරවල විශාලතම හිමිකරු ද විය.

වර්තමාන විපක්ෂ නායක යුශ්චෙන්කෝ ඔහුගේ පැත්තෙන් ඒ වන විටත් 1990 ගනන්වල බටහිර ධනපති අවශ්‍යතාවන් සමග සමීපව ක්‍රියාකරමින් සිටියේ ය. 1998 දී රුසියාව හා පැරනි සෝවියට් සංගමයේ අනෙකුත් රටවල් සොලවාලූ රූබල් අර්බුදය තුල දී තවතවත් නය සුරැකුම් ලබාගනිමින් බටහිර බැංකු සමග සබඳතාවන් දිගට ම පවත්වාගෙන යාමේ ලා යුක්රේන මහ බැංකු අධිපතියා ලෙසින් ඔහුට හැකිවිය. ඔහු තමන්ට ඇමරිකාව සහ යුරෝපය සමග වඩා යහපත් සබඳතාවන් ලඟාකර ගැනීමට උදව්වේය යි බලාපොරොත්තු වූ මූල්‍ය වංශාධිපති කල්ලි අතරේ ඔහුගේ කීර්තිය ඉහල දැමීමට මෙය හේතු විය. 1999 දෙසැම්බරයේ දී යුශ්චෙන්කෝ අගමැති කමට පත්විය.

කෙසේ වෙතත්, 1999 කොසෝවෝ යුද්ධය සහ යුගෝස්ලාවියානු ජනාධිපති ස්ලොබොඩාන් මිලොසෙවික් බලයෙන් පහකිරීමේ අවස්ථාවේ පටන් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ආධිපත්‍ය සඳහා වූ ආක්‍රමනශීලී පියවරයන් පෙරට ගැනීම මගින් තමන්ගේම ගෙල සිරකිරීමට පසුබට නො වන බව පිලිගැනීමට මෙම කොටස්වලට බල කෙරින. නැගෙනහිර දිග යුක්රේනයේ මූල්‍ය වංශාධිපතීන්ගේ බල පදනමට ඍජුවම තර්ජනය කරමින් ලාභදායක නොවන පතල් සහ වානේ කම්හල් වසාදැමීමට යුශ්චෙන්කෝ විසින් ම තර්ජනය කලේ ය.

එකල උප අගමැති සහ රුසියාව සමග බලශක්ති වෙලඳාම පිලිබඳව වගකීම දැරූ ටිමොශෙන්කෝ කුච්මාගේ බෑනා වූ ද නල මාර්ගවල අධිපතියා වූ ද පින්ෂක් සමග ගැටුමකට එලඹුනේ ය. 2001 ජනවාරියේ

දී තනතුරින් පහකල ඇය පරීක්ෂනයකට යටත් කරනු ලැබ සිරගත කරනු ලැබී ය. එම වසරේම අප්‍රේල් මාසයේ දී යුශ්චෙන්කෝව තනතුරින් ඉවත් කෙරින.

2003 නොවැම්බරයේ දී එඩුවාඩ් ෂෙවඩ්නාඩ්සේ බලයෙන් නෙරපා හැරීමට මුල් වූ ඇමරිකානු සහාය ලත් ජෝජියාවේ ''රෝස විප්ලවයෙන්'' අනතුරුව කුච්මා යලිත් වරක් මොස්කෝවට තුරුල්වීමට යත්න දැරී ය. ඉරාකයට සොල්දාදුවන් 1,600ක් යැවීම වැනි තවදුරටත් වොෂින්ටනයේ සිත දිනාගැනීමේ ප්‍රයත්නයන් බුෂ් පරිපාලනයේ හොඳ හිත ලඟා කර ගැනීමට අසමත් විය.

එක්සත් ජනපදය සිය ආක්‍රමනශීලි මූලෝපාය දිගට ම ගෙනයමින් විරුද්ධ පක්ෂ නායක යුශ්චෙන්කෝ පිම්බීමට වැඩ කලේ ය. ඔහුට ඩිමොක්‍රැටික් පක්ෂයේ ක්ලින්ටන් සමයේ රාජ්‍ය ලේකම් මැඩ්ලින් ඕල්බ්‍රයිට්, හිටපු ජනාධිපති ජිමිකාටර්ගේ ජාතික ආරක්ෂක උපදේශක සිබිග්නිව් බ්රෙෂෙන්ස්කි සහ මූල්‍ය අධිපතියෙකු වන ජෝජ් සොරෝස් සමග සමීප සබඳතා තිබේ. සෝරෝස් විසින් පිහිටවනු ලැබූ ආයතනයන්ගේ දායක මුදල්, සර්බියාවේ සහ ජෝජියාවේ පැවැති ආකාරයේ ''පෝරා'' (දැන් කාලය හරි) නම් යුක්රේන ශිෂ්‍ය ව්‍යාපාරය වර්ධනය කර නඩත්තු කිරීමට උදව් විය. විරුද්ධ පක්ෂයට සහාය දෙන පෙලපාලිවල පෝරා ඉදිරියෙන්ම සිටියේ ය.

විරුද්ධ පක්ෂයට ලැබෙන ජන සහාය පාර්ශවීය වසයෙන්, රටේ පවතින ව්‍යසනකාරී සමාජ තත්වය යහපත් කරගත හැක්කේ ආන්ඩු මාරුවකින් පමන ය යන බලාපොරොත්තුව මත රඳා පවතී. සෝවියට් සංගමය විසුරුවාලූ තැන් සිට යුක්රේනයේ මාසික සාමාන්‍ය ආදායම ඩොලර් 30 දක්වා පහත වැටී තිබේ. නගරවල මෙය යම්තමින් ඩොලර් 60 ඉක්මවන අතර කීව් වල ආසන්න වසයෙන් ඩොලර් 100 කි. 1989 හා 1999 අතර කාලයේ දී වියදම් කිරීමේ හැකියාව (මුදලේ ක්‍රය ශක්තිය) සියයට 40කින් පහල වැටුනේ ය.

සමාජ හා සුබසාධන ව්‍යුහයන් සහ පහසුකම් - මේවා සෝවියට් යුගයේ කම්හල් සමග දැඩිව බැඳී පවතී - විනාශ මුඛයට ගොසින් ය. ජීවිත අපේක්ෂාව කාන්තාවන්ට වසර 73 හා පිරිමින්ට වසර 62 ලෙස පහලට ඇද වැටුනි. මෙය රුසියාවට පසුව යුරෝපයේ අඩුම අනුපාතිකය යි. මේ අතර නව ඒඩ්ස් රෝගීන්ගේ අනුපාතිකය ලෝකයේ ඉහලම එකය. පසුගිය වසර කීපයේ දී 40 ලක්ෂයක් ජනයා යුක්රේනය හැර ගිය අතර පතල් අනතුරු නිසා සිදුවන මරනවලින් දෙවනි වන්නේ චීනයට පමනකි.

© www.wsws.org